**කෑගල්ල අධ්‍යාපන කලාපය**

**අ.පො.ස (සාමාන්‍ය පෙළ) නර්තන විෂය**

**ශාන්තිකර්ම ආශ්‍රිත ප්‍රශ්ණාවලිය**

---

***අංක 1 සිට 15 තෙක් ප්‍රශ්න වලට නිවරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න***

01* කොහොඹාකංකාරියට අයත් චාරිත්‍රයක් වන්නේ

01.තොටමෙට යාම 02. අයිලෙ යැදිම
03.මිල්ල කැපීම 04. පත්තිනි නැටීම

02* පොල්මල සහ දුන්න රංගභාණ්ඩ ලෙස භාවිත කරන නර්තන දැක්වෙන වරණය කුමක්ද

01. අස්නේ උඟරා යක්කම 02. පොල් පදය හා මුවමල විදීම
03. මඩුපුරය හා කෝල්පාඩුව 04. මඩුපුරය හා දුනුමාලප්පුව

03* දේවකෝල්පාඩුව හා කෝල්පාඩුව යන අංග අයත් නර්තන සම්ප්‍රදායන් පිළිවෙලින්

01. පහතරට සහ උඩරටය 02. සබරගමු සහ උඩරටය
03. උඩරට සහ සබරගමුය 04. පහතරට සහ සබරගමුය

04* ශාන්තිකර්මවල එන නාට්‍යමය පෙළපාලි වන්නේ

01. යක්කම් හා දෙවොල් ගොඩ බැසීමයි
02. රාමා මැරීම හා විජේරාජ කථාවයි
03. ගුරුගේ මාලාව හා කොලොන්න පද නැටීමයි
04. අඹවිදමන හා වැදි දානයයි

05* මල්මඩුපුරය,වාහල හා දුනුමාලප්පුව යන අංග පිළිවෙලින් දක්නට ලැබෙන්නේ

01. පහන්මඩුව , දෙවොල්මඩුව හා කොහොඹාකංකාරියේ
02. පහන්මඩුව , කොහොඹාකංකාරිය හා දෙවොල්මඩුව
03. දෙවොල්මඩුව , පහන්මඩුව  හා කොහොඹාකංකාරිය
04. රටයකුම , දෙවොල්මඩුව හා කොහොඹාකංකාරිය

06* ගායනා සහිත නර්තන අංග ඇතුලත් වරණය තෝරන්න

01. කොහොඹාහැල්ල , තොරන්යාගය , මුගුරුපද
02. කොහොඹාහැල්ල , තොරන්යාගය , දෙවොල්
03. කොහොඹාහැල්ල , පත්තිනි , කොලොන්නපද
04. පත්තිනි , තොරන්යාගය , කොලොන්නපද

07* කොහොඹාකංකාරිය ශාන්තිකර්මයේ දක්නට ලැබෙන සැරසිලි,

01. යහන , අයිලය හා යක්ගෙය
02. යහන , අයිලය හා තොරණ
03. යහන , අයිලය හා කාලපන්දම්ගසය
04. යහන , අයිලය හා බිසෝකපය

08* අසුර යක්කම ඇතුලත් ශාන්තිකර්මය අයත් වන්නේ,

01. උඩරට සම්ප්‍රදායටය
02. පහතරට සම්ප්‍රදායටය
03. සබරගමු සම්ප්‍රදායටය
04. උඩරට හා පහතරට සම්ප්‍රදායටය

09* කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ එන නර්තනාංග දෙකකි

01. අස්නේ සහ වැදි යක්කම
02. කොහොඹාහැල්ල සහ වැදියක්කම
03. අස්නේ සහ යක්ඇනුම
04. යක් ඇනුම සහ හඟලේ යැදීම

10* කොහොඹාකංකාරිය ශාන්තිකර්මයේ එන පුරාවෘත්ත කථාවේ චරිත දෙකකි

01. මහා සම්මත රජු හා කුවේණි
02. මහා සම්මත රජු හා මැණික්පාල
03. මලය රජු හා කුවේණි
04. මලය රජු හා මහා සම්මත රජු

11* කොහොඹාකංකාරියේ පුද ලබන ප්‍රධාන දෙවිවරු වන්නේ

01. කොහොඹාදෙවි හා දෙවොල් දෙවි
02. කොහොඹාදෙවි හා බණ්ඩාර දෙවි
03. වීරමුණ්ඩ දෙවි හා මංගර දෙවි
04. වීරමුණ්ඩ දෙවි හා දෙවොල් දෙවි

12* කොහොඹාකංකාරියේ මඩුව දිගින් සැට රියනක් හා පළලින්

01. තිස් රියනකි
02. එක් රියනකි
03. මිටි රියනකි
04. සැට රියනකි

13* "ඉන්ද්‍රදිශාවට ඉඹුල් විමානෙට හිරු දෙවි අධිපති වන්නේ" මෙම ග්‍රහපන්ති කවි ගායනා කරණු ලබන්නේ

01. කොහොඹාකංකාරියේය
02. බලි ශාන්තිකර්මයේය
03. මඩු ශාන්තිකර්මයේය
04. සූනියම් ශාන්තිකර්මයේය

14* මඩුපුරය නර්තනයට ගැනෙන රංගභාණ්ඩය වන්නේ

01. පොල්මලයි
02. ඊතලයයි
03. කොතලයයි
04. වංගෙඩියයි

15* උඩරට නර්තන සම්ප්‍රදායේ වට්ටම් නර්තනය කරණු ලබන්නේ

කොහොඹාකංකාරියේ එන .................... නර්තනාංගයේයි

01. අස්නේ 02. ආවැන්දුම
03. කොහොඹාහැල්ල 04. දුනුමාලප්පුවේය

**පහත සඳහන් ප්‍රශ්න වලට හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න**

**01.** මෙලෙයි යකුන් පිදීම හා රුප්පායකුන් පිදීම යන චාරිත්‍ර විධි අයත් වන්නේ................................ ශාන්තිකර්මයටය

**02.** උඩරට නර්තන සම්ප්‍රදායේ අස්නේ නර්තනය ගායනය ....................... නර්තනයකි

**03.** නර්තන සම්ප්‍රදායන් තුනටම පොදුවූ....................... ශාන්තිකර්මය නවග්‍රහයින් උදෙසා කරනු ලබයි

**04.** යහන්දැක්ම පහතරට නර්තන සම්ප්‍රදායේ මෙන්ම ....................... නර්තන සම්ප්‍රදායේද එන ශාස්ත්‍රීය නර්තනාංගයකි

**05.** ගුරුගේ මාලාව නාට්‍යමය අවස්ථාව ඇතුලත් වන්නේ .................. ශාන්තිකර්මයේය

**06.** සබරගමු පහන්මඩු ශාන්තිකර්මයේ ඇතුලත් ශාස්ත්‍රීය නර්තනාංග දෙකක් නම් කරන්න

1.................................................. 2....................................................

**07.** ශාන්තිකර්ම සැරසිලි සඳහා යොදා ගන්නා ස්වභාවික අමුද්‍රව්‍ය 2ක් වනුයේ

1................................................... 2.....................................................

**08.** දේශීය ශාන්තිකර්ම තුනටම පොදු වු ගායනා ........................................... ගායනා හා ...................................................... ගායනා වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට වෙන්කර දැක්විය හැක

සැකසුම ÷ පී.ඩි.එස් තිලකරත්න

ගලිගමුව ම.ම.වි